Published
Dayawansa Jayakody & Co.
Colombo, Sri Lanka.

Published by:
Sinhalese Cultural Forum
of NSW Inc. - 2008.

THIRASA THARANA - තිරස තරණ
A SHORT STORY Book (2008)
ISBN 978-955-600-6



# සිඩ්නි පුරයට ශිෂ්‍යත්වයක්

ෂෙල්ටන් පීරිස්

විශ්ව විද්‍යාලයේ දේශණ අවසන් කළ සැනින් එදින මා වේලාසනින්ම නිවසට පැමිණියේ ඉතාමත් සතුටිනි. මා එන විට ධම්මී සේවය නිමවී නිවසට පැමිණ සිටියාය.

"ආ! රංග අද මොකද වේලාසනින්ම. වැහි කළුවක් අහසේ පාවෙනවා. අද නම් වහීවි" ඇය මට සරදම් කළාය.

මා කිසිවක් නොකියා ගුවන් තැපැල් ලිපිය ඇය අතට දුන්නෙමි.

ලිපිය කියවූ ඇය "කන්ග්‍රැජුලේෂන්ස් රංග" කියමින් මා සිප ගත්තේ හද උතුරා යන සතුටකිනි.

"අපට එහෙනම් අද හෙටම ඕස්ට්‍රේලියා ගමනට සූදනම් වෙන්න වේවි. ඔයාට තව මාස දෙකකින් සිඩ්නි විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යත්වය බාර ගන්න ඕනැ. ඒ කාලයේ මටත් මොකක් හරි පොඩි මැනේජ්මන්ට් කෝස් එකක් කරන්න පුළුවන් වේවි නේද?" ධම්මී නොනැවතී කියවා ගෙන යයි.

ඒ සමගම සිහින ලෝකයකට පිවිසි මා අවදිවූනේ "රංග මේ තේ එක බොන්න. ඔන්න හැලපත් ඇති. අම්ම දුන්න උදේ. ඔයා හරිම ආසයිනේ?" යන ධම්මී ගේ කට හඬිනි.

"මුළදි මගේ කැමැත්ත තිබ්බේ කැනඩාවට යන්නයි. මං හිතන්නෙ ඕස්ට්‍රේලියාව ඊට වඩා හොඳයි කියලයි. විශේෂයෙන් සිඩ්නි වල දේශගුණය හොඳයි කියල මං අහල තියෙනවා" මම හැලපයක් කමින් පැවසුවෙමි. අම්මා සෑදූ හැලප වල ද ධම්මී ගේ තේ කෝප්පයේ ද මට වෙනද නැති මිහිරක් දැනේ.

* * *

අප දෙදෙනාම රැකියාවට යන බැවින් අපේ පුතණුවන්,

සඳකැන්, දිවා කාලයේ බලා ගන්නා ලද්දේ මගේ දෙමව්පියන් විසිනි. ගුරු වෘත්තියෙන් විශ්‍රාම ලබා මහ ගෙදර විවේක සුවයෙන් පසුවෙන ඔවුන් පුතා බලා ගැනීමෙන් ලැබුවේ අසීමිත ආශ්වාදයකි. මා නැගණියද කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය උපාධිය හදරණ බැවින්, දවල් කාලයේ දෙමව්පින් ඔවුන් ගේ කාන්සිය නිවා ගත්තේ සඳකැන් සමග කෙළිදෙලෙන් පසුවීමෙනි. අම්මලා සමග මහ ගෙදර විසීමට ඇති තරම් ඉඩ කඩ තිබුනද, ගමන් පහසුව නිසා අප වේයන්ගොඩ දුම්රිය පොල අසල නිවසක පදිංචිව සිටියෙමු.

"ධම්මී, අම්මට කෝල් කරල කියන්න අපි හය හමාරට විතර එහෙ එනව කියල." පුතා ගැනීමට යන අප සතියේ සෑම දිනකම පාහේ රාත්‍රී ආහාරය ගත්තේ දෙමව්පියන් සමගිනි.

"රංග අන්න අම්ම කියනව අද මුං මලවල, කරෝල උයල, අල තෙල් දල තියෙනව කියල. ඔයා කැමතිම කෑම ජාති නේ කවදත් අම්ම හදන්නේ!" ධම්මී සිනාසෙයි.

* * *

අප දෙදෙනා රැගත් මෝටර් රථය නිවසට ලඟා වන විට, තාත්තා ගේ අතේ ඉස්තෝප්පුවේ සිටි සඳකැන්, අපව දැක ප්‍රීතියෙන් අත්පොඩි ගසන්නට විය. මා පුතා වඩා ගත්තේ අසීමිත සෙනෙහසිනි.

මගේ සිත අතීතයට දිව යයි.

අම්මාත් තාත්තාත් දෙදෙනාම සේවය කලේ වේයන්ගොඩ දුම්රිය පොළ අසල පාසැලක වූ බැවින් නංගීත් මාත් ප්‍රාථමික අධ්‍යාපනය අවසාන කරන තෙක්ම එම පාසැලට යාමට සිදුවිය. පසුව ආනන්ද විද්‍යාලයේ අධ්‍යාපනය ඇරඹු පසු මගේ දින චර්යාව ඉතා කාර්ය බහුල එකක් බවට පත්විය. උදෑසන හය වන විට තාත්තා මා දුම්රිය පොළට ඇරලවයි. දුම්රියෙන් මරදනට යන මා පාසැලට ඇති කෙටි දුර ඇවිදිමි. සවස මා නිවසට පැමිණෙන්නේ හතරට පමණය. ගමන මුළදී අසීරු එකක් වුවත් පසුව යහළුවන් එකතු වීම නිසා එය විනෝද ජනක එකක් විය.

මා කෙමෙන් උසස් පෙළ කරා ලඟාවෙත්ම අම්මා නිතරම "පුතේ අර ගුරුන්නාන්සෙ මාම පුතාගෙ හඳහන බලල කීව පුතාට



බොහෝම ඉහලට ඉගෙන ගන්න වාසනාව තියෙනව කියල. පිටරට යන්න, පිටරට ජීවත්වෙන්න පවා සුදුසු ග්‍රහයන් පිහිටල තියෙනවළු" කීවේ මා තවත් උනන්දු කරවන්න විය යුතුයි.

ඊට පසු, උසස් පෙළ විභාගය, පේරාදෙණිය සරසවිය, කලාගාරය, ගැටඹෙ , හිල්ඩා, ජයතිලක, මාර්ස්, සඳසිරි, වූස් අවන් හල, වල, උපාධිය, කොළඹ සරසවියේ සහකාර කථිකාචාර්ය තනතුර, ධම්මී, විවාහය, පුතා... මේ සියල්ල මගේ දිවියට ලංවූයේ කෙතරම් චමත්කාර ජනක අන්දමට ද?

මම පුතාව තවත් තුරුළු කර ගතිමි.

* * *

ධම්මී ගෙන් ශිෂ්‍යත්වය ගැන දැනගත් අම්මා මා වෙත විත් "අනේ මගේ රත්තරං පුතාට සියළු දෙවි දෙවියන් ගේ පිහිටයි. මම හිතුව පුතා කවද හරි තව ඉහලට ඉගෙන ගනීවි කියල. හඳහනෙත් ඒක කියල තිබුනනේ. පුතා ආචාර්ය රංගසිරි ජයදාස වුනාම ඒක අපේ මේ ජයදාස ලොකු මහත්තයටත් ආඩම්බරයක්" කියමින් මගේ හිස අත ගෑවාය.

"ලොකු පුතේ, උපාධියෙන් පස්සෙ මේ රටට ආපහු ඇවිල්ල සේවය කරන්න හිතා ගන්න. පිටරට යන අය එහේ යාන්ත්‍රික ජීවිතයේ පිට ඔපයට රැවටිලා, ඒකට පුරුදු වෙලා එහේම නවතිනවළු."

"නෝන මේ මොනව කියනවද මන්ද? පුතා මේ තවම යන්න හිතුව විතරයි. අපි දැන් එයාලගෙ ගමනට ඕනැ දේවල් සූදනම් කරන්න පටන් ගනිමු. තව මාස දෙකක් විතරයිනෙ තියෙන්නේ!" කිසිම දෙයකින් ලේසියෙන් නොසැලෙන, අට ලෝ දහම ඉතා හොඳින් අවබෝධ කර ගත්, කර්ම ඵල වාදය තරයේ විශ්වාස කරන තාත්තා ඉදිරිපත් කලේ නම් ඉතා සුදුසු අදහසක් යැයි මට සිතුනි.

එහෙත් අම්මා "ලොකු මහත්තයට නම් මොකද? මට තමයි මේ චූටි පැටිය නැතුව තනි වෙන්න වෙන්නේ. ලොකු වෙලා ආච්චි අම්ම බලන්න එන්න චූටි පැටියෝ" කියා මගේ අතින් පුතා උදුරා ගෙන තරයේ සිප වැලඳ ගත්තා ය.

එදා රෑ බෝ වී අපි නිවස බලා පැමිණියේ ඉක්මනින්ම ඕස්ට්‍රේලියා ගමනට ලැස්ති විය යුතු ආකාරය සැලසුම් කරමිනි.

* * *

මා හිතුවාටත් වඩා ඉක්මනින් සියළු කටයුතු සූදනම් විය. සති දෙකක් ඇතුලත වෛද්‍ය පරීක්ෂණයට සහභාගී වූ අප දෙදෙනා ට ඉන් සතියකට පසු ගමන් බලපත්‍ර රැගෙන මහ කොමසාරිස් කාර්යාලයට එන ලෙස දන්වා තිබීම කෙතරම් භාග්‍යයක් ද? එතැන් සිට ඉතිරි සති කිහිපය ගෙවී ගියේ ඉතා වේගයෙනි.

අම්මා, ධම්මී ගේ මව හා එකතු වී ගමනට අවශ්‍ය සියළු දේ පිළියෙල කරන්නට වූවාය.

"අම්මෙ, ඔච්චර මිරිස් තුනපහ ඕනැ නැහැ. එහෙන් ගන්න පුළුවන්නෙ?"

"කමක් නෑ පුතේ, මේව ගෙනියන්න. මේ ගෙදර හදපුව. කඩේ ඒව රහ නැනෙ?" ඒ ධම්මී ගේ අම්මාය.

"ආ රංග මගේ ක්ලාස් මේට් කෙනෙක් චතුරානි කියල දැන් සිඩ්නි වල ඉන්නව කියල අර බැංකුවෙ වැඩ කරන නිලූෂ කිව්ව. ටෙලිෆෝන් නොම්මරේත් දුන්න. අපි අද රෑට කතා කරමු. විස්තර ටිකක් දැනගන්න පුළුවන්නේ! කොහොමටත් පරණ යාළුවො ඉන්න එකත් හොඳයි." ධම්මී කීවාය.

ධම්මී ගේ කතාව ඇසූ චතුරානී, ඉතා සතුටට පත් වී, ඔවුන් අප පිළිගැනීමට ගුවන් තොටුපලට එන බවත්, නිවසක් කුලියට ගන්නා තුරු අපට ඔවුන් සමග නවාතැන් ගත හැකි බවත් පවසා ඇත. ඇගේ සැමියා ඉංජිනේරුවෙකු බවත්, දරුවන් තවම කුඩා නිසා ඇය රැකියාවක් නොකරන බවත් චතුරානී තව දුරටත් පවසා තිබුනි.

"චතුරානි ල ඉන්නෙ ග්ලෙන්වුඩ් කියන ගමේලු. ඒ ලඟ තියෙනවලු ලංකාවෙ අයගෙ පන්සලකුත් ලංකාරාමෙ කියල."

ධම්මීගේ ඒ කතාව ඇසූ අම්මා ඉතා සතුටට පත්විය.

"ඒක හරිම හොඳ දෙයක් පුතේ. වැඩ පටන් ගන්න ඉස්සෙල්ල, බුදුන් වැඳල, බෝධි පූජාවක් කරල, දෙයියන්ට පින් දෙන්න.



තුණුරුවන් ගෙ ආශිර්වාදය ලබා ගන්න ඒක හරිම වාසනාවක්!"

* * *

අප සිඩ්නි නුවරට ලඟා වූයේ සෙනසුරාදවක උදේ වරුවේය. අප එනතුරු ගුවන් තොටු පලේ රැඳී සිටි චතු සහ සිරිදේව අප පිළිගත්තේ ඉමහත් සෙනහසකිනි. සිරිදේව මා හා කතා කලේ අප ඉතා දිගු කළෙක සිට දන්නා අඳුරන මිතුරෙකු ලෙසය. ඔහු ඉතා විවෘත අදහස් ඇති පුද්ගලයෙක් විය.

"රංග අපට විනාඩි හතලිස් පහක විතර යනව ගෙදර යන්න. මේ ලඟ තියෙන මැක්ඩොනල්ඩ් එකෙන් මොනව හරි කාල තේ බීල යමුද?"

"නෑ. ඕනැ නෑ සිරි. අපි ප්ලේන් එකේදී උදේට කැවා. ගෙදර ගිහිල්ලම තේ බොමු."

දැන් අපි සිටින්නේ කොහේදැයි නොදත් පුතා ධම්මී ගේ ඇකයේ සුවසේ නිදයි.

"රංග දැන් අපි යන්නේ සිඩ්නි වලින් බටහිරට. අද සෙනසුරාද හින්ද ට්‍රැෆික් ටිකක් අඩුයි."

"බලන්න සිරි. කවුරුවත් මෙහේ හෝන් ගහන්නේ නැනේ. හරිම පිළිවෙලට වාහන පාරේ යනවා. ලංකාව වගේ නෙමේ."

"ටික කලක් යනකොට රංගත් ඕවට පුරුදු වෙයි. මෙහෙ ඩ්‍රයිවින් හරිම ලේසියි."

ටික වේලාවකට පසු අපි සිරිදේවලා ගේ නිවසට ලඟාවීමු. එය පිහිටා තිබුනේ නවීන පන්නයේ නිවෙස් වලින් පිරි අළුත් ගම්මානයක ය. අවට පරිසරයට මගේ සිත ඇදී ගියේ නිතැතිනි.

කාරයේ දොර අරින ගමන් සිරි කතා කලේය.

"පුතයි දුවයි තවම නිදි ගෙදර. මේ ලඟ ඉන්න අපේ යාළුවෙක් උදේම ගෙදර ආව එයාලව බලා ගන්න."

කාරයේ හඬ ඇසී කාන්තාවක් අප දෙසට ආවේ සිනාසෙමිනි.

"ගුඩ් මෝනින් ධම්මී, රංග, වෙල්කම් ටු සිඩ්නි. මම හිමාලි."

ඇය මගේ අතට අත දී ධම්මීව වැළඳ ආචාර කලේ මීට පෙර දන්නා හඳුනන ලෙසිනි.

අළුතින් සෑදූ දෙමහල් ගෘහයක් වූ, සිරිදේවලාගේ නිවස ද්විත්ව ගරාජයකින් සමන්විත විය. නිවසට ඇතුළු වූ පසු වම්පස සාලයද, දකුණු පස කන්තෝරු කාමරය සහ කෑම කාමරයද පිහිටා ඇත. ගෙයි මැද කුස්සියද ඒ පිටු පස විශාල රම්පස් ශාලාවද පිහිටා ඇත. උඩු මහල නිදන කාමර හතරකින් සහ විසිත්ත කාමරයකින් සමන්විත වේ.

චතු අපට කාමරයක් පෙන්නුවා ය.

"එහෙනම් ඔයාලා මේ කාමරේ ගන්න. ටිකක් විවේක අරගන්න. බාත් රූම් එක අතන. මමයි හිමාලියි උදේට කෑම ටිකක් ලෑස්ති කරන්නම්."

* * *

උදෑසන ආහාරය සඳහා චතු සහ හිමාලි රසැති කිරිබතක්, ලුනුමිරිස් සහ කරවල බැදුමක් සමග සාද තිබුනි. මගේ රස නහර පිනා ගියේය. නිතැනින්ම සිහිවුනේ අම්මා, තාත්තා ඇතුළු ලංකාවේ සියළු දෙනාවයි.

එය ඉවෙන් මෙන් දැනගත් සිරි "රංග දැන් මෙහේ ටිකක් දවල් වෙලා. ලංකාවෙ අයත් මේ වන කොට නැගිටලා ඇති. අම්මලට කෝල් කරල විස්තර කියන්න. කට්ටිය බලාගෙන ඇතිනේ" යැයි කීවේය.

අපේ විස්තර ඇසූ අම්මාගේ එකම ප්‍රාර්ථනය වූයේ "අනේ පුතේ උඹලට තුණුරුවන්ගෙ පිහිටයි. සියළු දෙවි රැකවරණ ලැබෙන්න ඕනෑ" යන්නයි.

එය ඇසූ මගේ දෙනෙත් කඳුලින් පිරුණි.

* * *

"කොහේ ද සිරි අපිට ඉන්න හොඳ පලාත?"

"ෆ්ලැට් එකක් කුලියට ගන්න පැරමටා පැත්ත හොඳයි. කෝච්චියට ලඟ හින්ද රංග ට යුනිවසිටි යන්නත් ලේසියිනෙ. ඒත් කළබල වෙන්න එපා. මෙහේ සතියක් දෙකක් ඉන්න. අපි හිමිහිට තැනක් බලමු."

සිරි ඕස්ට්‍රේලියාව ගැනත්, සිඩ්නි ගැනත් කතා කලේ මහත්



පැහැදීමෙන්. තම මව් බිමෙන්, නෑදෑ හිත මිතුරන් ගෙන් වෙන්වීම දුකක් වුනත් මෙහි පවතින සාමකාමී දිවි රටාව, ස්ථාවර දේශපාලන පැවැත්ම ගැන ඔහු කතා කලේ මහා පඬිවරයෙක් ලෙසින්.

"ඒත් රංග මෙහෙත් ඉන්නවා බොහොම ප්‍රවේශම් විය යුතු අය. ඒ අයව දැක්ක ගමන්, වචනයක් දෙකක් කතා කල ගමන් ඉක්මනින්ම අඳුන ගන්න පුළුවන්" ඔහු වැඩි දුරටත් කීවේය.

එද හවස් යාමයේ ලංකාරාමයට ගිය අපි, බුදුන් වැඳ, බෝධි පූජාවක් පවත්වා, නායක ස්වාමීන් වහන්සේ හමුවීමු. උන්වහන්සේ ගේ ඉතාමත් තැන්පත් කාරුණික කතාබහ මගේ හිත ගත්තේ නිතැතිනි.

"ආ සිරිදේව මහත්තය. මේ යාළුවෙක් වෙන්නැති."

"එහෙමයි, හාමුදුරුවනේ. මේ රංගසිරි ජයදාස. අදයි ලංකාවෙ ඉඳල ආවෙ පී.එච්.ඩී. එකක් කරන්න ශිෂ්‍යත්වයක් ලැබිල. කොලඹ විශ්ව විද්‍යාලයෙ තමයි වැඩ කරන්නෙ."

"බොහෝම හොඳයි. හොඳ වැඩක් පටන් ගන්න ඉස්සෙල්ල තුණුරුවන්ගෙ ආශිර්වාදය ලබාගන්න එක බොහොම හොඳ, ශුභ ලකුණක් මහත්තයො. සියළු වැඩ ඉතාමත්ම සාර්ථක වෙනවා ඒකාන්තයි. එන්න මම හැම දෙනාටම පිරිත් නූල් ගැට ගහන්න."

අප පංසලෙන් පිටත්වීමට පෙර සිරි ගේ මිතුරන් කිහිප දෙනෙක් ද හඳුනා ගැනීමට ඉඩ ලැබුනි.

ආපසු නිවස බලා එන අතරතුර සිරි "රංග මම අර අන්තිමට හඳුන්වල දුන්න නේද ගජධීර කියල කෙනෙක්. බොහොම පරිස්සම් වෙන්න ඕනෑ එයාගෙන්. මිනිහ හරිම අණ්ඩපාලයා" කියා කීවේ සිනාසෙමිනි.

"ඒ මොකද සිරි?"

"ලංකාවෙ ලොකු වංචාවක් කරල නඩුවෙන් බේරෙන්න මෙහෙට පැනල ඉන්නව. ඔය වගේ කීප දෙනෙක්ම මෙහේ ඉන්නව. දිගටම මෙහේ හිටියොත් මේ රටත් කාවි."

අපි සියළු දෙනාම සිනාසුනෙමු.

* * *

එදින රාත්‍රී කෑම සඳහා හිමාලි ද, ඇගේ සැමියා සහ දරුවන් ද පැමිණ සිටි බැවින් ලංකාවෙන් පිටත සිටින බවක් අපට නොදැනුණි. රාත්‍රී ආහාරයෙන් පසු අපි තවත් බොහෝ විස්තර කතා කළෙමු.

"කොහොමද සිරි මෙහේ ජීවන රටාව."

"මම නම් හරිම කැමතියි. නිදහසේ ඉන්න පුළුවන්. ඒත් ටිකක් සමාජයේ වැඩ වලට උදව් වෙන්න ඕනැ. නැතිනම් තනිවම ඉන්න වෙනව. හැබැයි ඒත් බොහොම ප්‍රවේශමෙන් ජීවත් වෙන්න ඕනැ. අපේ දෙමව්පියන්, අපි ඉපදුනු රට, අපේ සංස්කෘතිය, අපේ අධ්‍යාපනය, අපිට දුන්න දයාදයන් තමයි හොඳ ගති පැවතුම්. අපි ඒව ආරක්ෂා කරගන්න ඕනැ.  ඒව අපේ දරුවන්ට ආඩම්බරයෙන් කියා දෙන්න ඕනැ. ඒව අගය කරන්න ඕනැ. එතකොට ළමයිනුත් හොඳ මග යනවා."

"මම දන්න පවුල් කිහිපයක් ඉන්නවා. ඒ අය දැන් ලත වෙනවා. ඒ මොකද එදා ඒ අය තර්ක කලා මෙහේ ඉන්න කොට මෙහේ විදියට හැඩ ගැහෙන්න ඕනැ කියලා. ඔවුන් ගෙ හොඳ ගති පවා ඔවුන් මෙහේ සමාජයට පාවා දුන්නා. අපි ළමයන්ට සිංහල උගන්වන්න පාසැල් පටන් ගන්න යනකොට අපිට හිනාවුනා. අවුරුදු 16-17 වෙන කොට ළමයින් ගෙදරින් ගියා. ඒක තමයි මෙහේ සම්ප්‍රදය. ඊට පස්සෙ, පංසල, පල්ලිය, ආගම, ලංකාව මතක් වුනා. ඒත් එතකොට ප්‍රමාද වැඩියි."

"දැන් රෑ දෙළහටත් කිට්ටුයි. අපි හෙට සිඩ්නි සිටි එක පැත්තෙ ටිකක් ඇවිදිමු. ඔපෙරා හවුස් එක බලන්නම ඕනැ තැනක්."

"සිඩ්නි විශ්ව විද්‍යාලය තියෙන්නෙත් ඒ පැත්තෙද සිරි?"

"ඔව් රංග ආපහු එන ගමන් අපි එහෙත් යමු. ඒක තමයි ඕස්ට්‍රේලියාවෙ හදපු පලමු විශ්ව විද්‍යාලය."

* * *

චතු ගේ බලවත් ඉල්ලීම නිසා අපිට සති දෙකක් පමණ ඔවුන් සමග විසීමට සිදුවිය. ඉන්පසු හිත මිතුරු සැමගේ ද සහාය ඇතුව පැරමටා නම් ප්‍රදේශයේ කාමර දෙකක තට්ටු නිවසක් කුලියට ගැනීමට අපට හැකිවිය.



"රංග මල්ලී, මේ ලඟ තියෙනව සිංහල උගන්වන පාසැලක්. ඒක පවත්වන්නෙ ඉරිද උදේට. මෙහේ හැදෙන වැඩෙන අපේ දුවල-පුතාලට සිංහල පිළිබඳ මූලික දැනුමක් දෙන්න තමයි අපි උත්සාහ කරන්නේ. විවිධ ප්‍රසංග හෙම සංවිධානය කරල අපි දරුවන් ට සංස්කෘතිය ගැනත් අවබෝධයක් ලබා දෙනව. මේ කටයුතු වලට මූලිකත්වය දෙන්නෙ සිංහල සංස්කෘතික හමුව මගින්. මල්ලි කැමති ද ඒකෙ සිංහල උගන්වන්න සමාජ සේවයක් විදියට?" අසල නිවසක පදිංචිව සිටි හිතවත් ගුණසේන අයියා මට කියා සිටියේය.

ධම්මීත් මාත් දෙදෙනාම සිංහල පාසැලේ සිංහලත්, බුද්ධාගමත් ඉගැන්වීමට බාර ගත්තේ ඉතා කැමැත්තෙනි.

එය ඇසූ අම්මා සහ තාත්තා ද ඉතා සතුටට පත්වූහ.

"අනේ, පුතේ ඒක කොච්චර හොඳ වැඩක් ද? තමන් දන්න දේ කියල දීල වෙනත් කෙනෙකුගේ දැනුම වැඩි කිරීම හරිම හොඳ සේවයක්. අපි දෙන්නම, අපේ ජීවිත කාලෙම කැප කලේ ඒකටනේ."

* * *

සිංහල පාසැලට සම්බන්ධ වීමෙන් පසු, අපට සිඩ්නි නුවර වෙසෙන ඉතා සද්ගුණවත් විශාල පිරිසක් හඳුනා ගැනීමට ද අවස්ථාව ලැබුනි. එය ඉතාමත් භාග්‍යයක් විය. පාසැලේ විවිධ ප්‍රසංග, සංස්කෘතික හමුව සංවිධානය කරන බක් මහ රංගන සංදර්ශනය, අළුත් අවුරුදු උළෙල, නිදහස් උළෙල ආදී උත්සව රාශියකට සහභාගී වීමට ද අවස්ථාව ලැබුනි.

සිංහල පාසැලේ දරු දැරියන් පුහුණු කර වෙසක් පොහෝ දින ලංකාරාමයේ භක්ති ගී ගායනා කිරීමට පසුගිය අවුරුදු කිහිපය තුල හැකිවීම ගැන මටත් වඩා සතුටු වූයේ ධම්මී ය.

* * *

අවුරුදු හතරක පමණ කාලයක් මෙසේ ඉතාමත් ඉක්මනින් ගෙවී ගියේ ජීවිතයේ නොමැකෙන මතක සටහන් තබමිනි. මගේ උපාධියේ ප්‍රතිඵල ඇසූ අම්මා ඉතා සතුටට පත්වූවාය. මෙහි නැවතී රැකියාවක යෙදීමට අවස්ථා එමට ඇතත් අපි තිදෙනා නැවත දෙසැම්බරයේ ලංකාවට එන බව ඇසීමෙන් ඒ සතුට දෙගුණ

තෙගුණ වූ බවට සැකයක් නැත.

"අපි දැන ගෙන හිටිය අපේ පුතා කවදාවත් උපන්න රට අමතක කරන්නෙ නෑ කියල. පුතා ආපු ගමන්ම අපි මේ දේපල සේරම ලියල දන්නයි ඉන්නෙ නංගිටයි පුතාටයි."

"මට නම් දේපොල ඕනැ නෑ අම්මෙ. ධම්මීගෙත් වතුපිටි තියෙනවනේ. අපේ ඒව ඔක්කොම නංගීට දෙන්න."

"නෑ පුතා මේව අපේ යුතුකම්."

ජයග්‍රාහී සිතින් යුතුව, දහසක් බලාපොරොත්තු සහිතව අපි දෙසැම්බරයේ ලංකාව ට පැමිණියෙමු.

* * *

පිට රට ගිය පුතුට යන මැයෙන් ලියා අම්මා ඒ දිනවල මා වෙත එවන ලද කවි කිහිපයක් තවමත් මගේ මතකයේ රැඳී ඇත.

වැඩි දුර ඉගෙනීම පිණිස එතෙරට ගිය පුතේ
දැනුම ලබා රට හදන්න නැවත එන්න පුතේ
ගම පාළුයි මට පාළුයි නුඹ නොමැතිව පුතේ
පියඹ, පොඩි පුතා සමගින් හනික එන්න පුතේ

මවත් පියත් දන් පින් කර සැනසෙනවා පුතේ
එපින් බලෙන් තුනු රුවනේ සරණ නුඹට පුතේ
සසර වසන තුරු මා නුඹෙ මව් වේවා පුතේ
මෙතේ බුදුන් දැක අප සැම නිවන් දකිමු පුතේ

දස මසක් කුසේ දරා, කවා පොවා, හද වඩා ගත් දරුවන් ලොකු මහත් වී පිටරට ගිය සැම අම්මා කෙනෙකුගේ ම ප්‍රාර්ථනය එය නොවන්නේ ද? මෙය එවැනි අම්මලාට උපහාරයක් වේවා!

**නිමි**